තොරතුරු මාසිකය

# විමර්ශන

2026 ජනවාරි | පෙරවාරි

ජනතා විමුක්ති පෙරමුණේ අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

07 කලාපය

# දිට්වා සහ ආර්ථිකය

**දිට්වා සුළි කුණාටුව අප රටෙහි සමාජ, ආර්ථික, දේශපාලනික යන අංශ තුන කෙරෙහිම දැඩි බලපෑමක් කිරීමට සමත් විය. එහි දේශපාලන බලපෑමේදී වැඩි වාසිය සිදුවූයේ ආණ්ඩුවට ය. ආපදාවෙන් වාසියක් ලබා ගැනීමට විපක්ෂය උත්සාහ ගත්ත ද, එය අසාර්ථක විය. මෙම ආපදා තත්ත්වයෙන් සිදුවූ සමහර සමාජීය බලපෑම් සමනය කරගත හැකි වුවද, ජීවිතවලට සිදුවූ හානි නිසා ඇති වූ බලපෑමට කළ හැකි යමක් ඉතිරි වන්නේ නැත. එහෙත්, දිට්වා සුළි කුණාටුව නිසා සිදුවූ ආර්ථික බලපෑම සාකච්ඡා කිරීම වැදගත් වේ. සත්‍යය ලෙසම දිට්වා සුළි කුණාටුව නිසා ආර්ථිකයට සිදුවූ බලපෑම කුමක් ද?**





දිට්වා සුළි කුණාටුව නිසා පුද්ගලයන් ලක්ෂ 22කට පමණ හානි සිදුවූ අතර, පවුල් 6,20,000ක් පමණ ආපදාවට මුහුණ දුන්හ. ඒ අතර, සම්පූර්ණයෙන්ම නිවාස අහිමි වූ අය ද, කඳු නාය යාම නිසා ජීවිත සහ දේපොළ ද විශාල ලෙස හානි විය. ප්‍රාග්ධන වත්කම් ලෙස පාලම්, බෝක්කු, මහාමාර්ග, දුම්රිය මාර්ග, විදුලි රැහැන්, විදුලි කණු සහ ට්‍රාන්ස්ෆෝමර් ඒ අතර වේ. මෙයට අමතරව ව්‍යාපාරික ස්ථාන, නිවාස, කඩ විශාල සංඛ්‍යාවක් ද හානියට පත් විය. මෙම හානිය දළ වශයෙන් ඇස්තමේන්තු කර ඇත්තේ එක්සත් ජනපද ඩොලර් බිලියන 4.1 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1,230)ක් ලෙස ය. මෙම ඇස්තමේන්තුව යටිතල පහසුකම් නැවත ගොඩනැඟීම සඳහා වන නිවැරැදිම තක්සේරුවක් නොවන අතර, ඒවා ගොඩනැඟීමට යන කාලය සහ අනාගත කොන්ත්‍රාත් මිල අනුව බොහෝ දුරට වෙනස් වීමට ඉඩ තිබේ. කෙසේ වෙතත්, මෙම ඩොලර් බිලියන 1,230 රජය විසින් ලබා ගන්නා ආකාරයත්, එය යොදවන ආකාරයත් අනුව එය ආර්ථිකයට කුමන ආකාරයක බලපෑමක් කරාවි ද යන්න සලකා බැලීම වටී.

ආපදා තත්ත්වය උදා වූ මොහොතේ සිට ආණ්ඩුව තම පාර්ශ්වයෙන් උපරිම මැදිහත්වීම කළ නිසා සිදුවීමට තිබූ දේපොළ සහ ජීවිත හානිය විශාල ලෙස අඩු විය. මේ සඳහා ආරක්ෂක අංශ සහ රාජ්‍ය යාන්ත්‍රණය උපරිම ලෙස මැදිහත් වූ අතර, ස්වේච්ඡා සංවිධානවල සහ ජනතාවගේ මැදිහත්වීම් ඉහළ මට්ටමක පැවැතිණි. එනිසාම වෙනදාට වඩා උද්‍යෝගයක් පොදු ජනතාව තුළ තිබූ අතර, උදවු කිරීම සඳහා ඔවුහු ක්ෂණිකව මැදිහත් වූහ. එහෙත්, මෙවැනි ආපදාවකදී වෙනදා දකින, තැන තැන බොහෝ අය කරන ආධාර එකතු කිරීම් මේ අවස්ථාවේ යම්තාක් දුරකට අඩු වී තිබිණි. ආපදාව සිදුවූ අවස්ථාවේම රජය මඟින් ආධාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ගිණුමක් විවෘත කිරීම නිසා මෙවැනි ආපදාවකදී වංචා කිරීමට මැදිහත් වන කණ්ඩායම්වලට එම අවස්ථාව ගිලිහී ගියේ ය. එලෙසම ද්‍රව්‍ය ආධාර එක්රැස් කිරීම ද රාජ්‍ය ආයතන මැදිහත් වී සිදු කිරීම නිසා ජනතාවට ආධාර ලබා දීම පිළිබඳව දෙගිඩියාවක් ඇති නොවී ය. එනිසාම විශාල ද්‍රව්‍ය ආධාර ප්‍රමාණයක් ජාතික තරුණ සේවා මධ්‍යස්ථානයට ද ලැබී තිබිණි.

අනෙක් අතට වසරක් වැනි කෙටි කාලයක් තුළ ආර්ථිකය යහපත් ලෙස කළමනාකරණය කර තිබීම නිසා ආපදාවෙන් සිදු විය හැකිව තිබූ ආර්ථික අර්බුදය වළක්වා ගැනීමට හැකි විය. 2018 වසරේදී භාණ්ඩාගාර ගිණුමේ ශේෂය බිලියන 180ක අයිරාවක් (ඍණ ශේෂයක්) ලෙස පැවැතිණි. එහෙත්, 2025 වසර අවසාන වන විට එය රුපියල් බිලියන 1,200ක අතිරික්තයක් දක්වා වර්ධනය කර ගැනීමට රජයට හැකි වීම නිසා ආර්ථිකයේ ඇති වීමට තිබූ මූල්‍ය හිඟය වැළැකී ගියේ ය. එම නිසා රජයට පහසුවෙන් රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවේදී අනුමත කර ගැනීමට හැකි විය. එනිසාම ඉතා පහසුවෙන් ආපදා සහන සේවා ක්‍රියාත්මක කිරීමට හැකි විය. එයට අමතරව විදේශ විනිමය ඉපැයීම ඉහළ මට්ටමක පැවැතීම ද මෙම ආපදා තත්ත්වය යම්තාක් දුරකට සමනය කර ගැනීමට හැකි විය. 2025 වසරේ ලංකාවේ වැඩිම සංචාරකයන්ගේ පැමිණීම සටහන් කළ වසර වීමත්, ලංකාවේ විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ වැඩියෙන්ම ලද වසර ලෙස ඩොලර් බිලියන 8ක විදේශ විනිමය ලැබීමත්, අපනයන ආදායම ඉහළ යාමත් යන කරුණු නිසා ආර්ථිකයේ විදේශ විනිමය ගැටලුව ද වාසිසහගත ලෙස විසැඳී තිබීම මෙම ආපදා අවස්ථාවේ ආර්ථිකය කළමනාකරණය කර ගැනීමට මහත් රුකුලක් විය.

මෙම ආපදා අවස්ථාවේදී රජය විසින් ඉතිහාසයේ වෙනත් කිසිදු රජයක් ලබා




# 'දිට්වා' විනාශය දත්ත ඇසුරින්

නොවැම්බර් 27 සිට 29 දක්වා කාලය තුළ 'දිට්වා' (Ditwah) සුළි කුණාටුව දිවයින හරහා හමා ගිය අතර, පැයට කිලෝමීටර් 65-90 දක්වා වේගවත් සුළඟක් සමඟ අධික වර්ෂාපතනයක් දිවයින පුරා දිස්ත්‍රික්ක ගණනාවකින් වාර්තා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් මධ්‍ය කඳුකරය ප්‍රමුඛව දිවයිනේ දිස්ත්‍රික්ක 25ටම අඩු-වැඩි වශයෙන් ගංවතුර සහ නායයාම්වලින් බලපෑම් එල්ල විය.

**සමස්ත හානිය සහ බලපෑම:**

- **මුළු භෞතික හානිය:** ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1කි (මෙය 2024 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 4%කි).
- **මියගිය සංඛ්‍යාව:** 640ක් ලෙස වාර්තා වේ (දෙසැම්බර් 11 වන විට).
- **අතුරුදහන් වූ සංඛ්‍යාව:** 211කි.
- **පීඩාවට පත් මුළු ජනගහනය:** මිලියන 1.6ක් හෙවත් මුළු ජනගහනයෙන් 7%කි.
- **පීඩාවට පත් කාන්තා සහ ළමා සංඛ්‍යාව:** කාන්තාවන් මිලියන 1.2ක්, ළමුන් 5,22,000ක් සහ වැඩිහිටියන් 2,63,000ක් පීඩාවට පත්ව ඇත.

අංශ අනුව හානි (ඇමෙරිකානු ඩොලර් මිලියනවලින්):

- **යටිතල පහසුකම්:** ඩොලර් මිලියන 1,735කි (මුළු හානියෙන් 42% කි).
- **නිවාස** (භාණ්ඩ ද ඇතුළුව): ඩොලර් මිලියන 985කි (මුළු හානියෙන් 24%කි).
- **කෘෂිකර්මාන්තය:** ඩොලර් මිලියන 814කි (මුළු හානියෙන් 20%කි).
- **නිවාස නොවන ගොඩනැගිලි** (ව්‍යාපාරික/පොදු): ඩොලර් මිලියන 562කි (මුළු හානියෙන් 14%කි).

**වැඩිම හානියට පත් දිස්ත්‍රික්ක** (ඇමෙරිකානු ඩොලර් මිලියනවලින්)

1. මහනුවර: ඩොලර් මිලියන 689.
2. පුත්තලම: ඩොලර් මිලියන 486.
3. බදුල්ල: ඩොලර් මිලියන 379.
4. කෑගල්ල: ඩොලර් මිලියන 367.
5. කුරුණෑගල: ඩොලර් මිලියන 302.

**කෘෂිකාර්මික:**

- වී වගාව: හෙක්ටයාර 1,00,000කට අධික ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම විනාශ වී ඇත.

ගොඩනැගිලි සහ යටිතල පහසුකම් හානි:

- නිවාස: 6,000කට අධික සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති අතර, 1,12,000කට පමණ අර්ධ වශයෙන් හානි වී තිබේ.
- පාසල්: 1,000කට වැඩි ප්‍රමාණයකට හානි සිදු වී තිබේ.
- රෝහල්: රෝහල් 100කට වැඩි සංඛ්‍යාවකට හානි සිදු වී ඇති අතර, ඉන් තුනකට බරපතළ හානි සිදු විය.
- නාය යාම්: දිවයින පුරා තනි නාය යාම් 1,600ක් පමණ හඳුනාගෙන ඇති අතර, ඉන් වැඩිම ප්‍රමාණයක් මහනුවර (447), නුවරඑළිය (372) සහ බදුල්ල (364) දිස්ත්‍රික්කවලින් වාර්තා වේ. නාය යාම් හේතුවෙන් බලපෑමට ලක්වූ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 38ක් පමණ වේ.

(ඉහත දත්ත 2025 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට බලපෑ 'දිට්වා' (**Ditwah**) සුළි කුණාටුව හේතුවෙන් සිදුවූ සෘජු භෞතික හානිය පිළිබඳව 2025 දෙසැම්බර් 17 දින නිකුත් කරන ලද ලෝක බැංකුව තක්සේරුව ඇසුරිනි. (Global Rapid Post - Disaster Damage Estimation (GRADE) Cyclone Ditwah 2025 Sri Lanka).

**1. මාර්ග පද්ධතියට සිදු වූ හානි:** (Road Network Damage)

- **A සහ B ශ්‍රේණියේ මාර්ග:** දිවයින පුරා ප්‍රධාන මාර්ග කිලෝමීටර් 247කට අධික ප්‍රමාණයකට දැඩි ව්‍යුහාත්මක හානි (කඩාවැටීම්, ගිලාබැසීම්) සිදු විය.

● **පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මාර්ග:** ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 16,000 ක් පමණ ජලයෙන් යටවීම නිසා මතුපිට ස්ථර (Carpeting/Tar) සේදී ගොස් තිබුණි.

● **අධිවේගී මාර්ග:** දක්ෂිණ අධිවේගී මාර්ගයේ සහ පිටත වටරවුම් මාර්ග යේ ස්ථාන කිහිපයක පස් කඩාවැටීම් වාර්තා වූ අතර, ගැලනිගම සහ වැලිපැන්න හුවමාරු (Interchanges) ජලයෙන් යටවීම නිසා දින 3ක් වසා තැබීමට සිදු විය.

**2. පාලම් සහ බෝක්කු** (Bridges & Culverts)

● **සම්පූර්ණයෙන්ම විනාශ වූ පාලම්:** කුඩා සහ මධ්‍යම පරිමාණයේ පාලම් 42ක් සම්පූර්ණයෙන්ම කඩාවැටී ඇති බව RDA වාර්තා කරයි.

● **ව්‍යුහාත්මක හානි:** පාලම් සහ බෝක්කු 480 කට අධික ප්‍රමාණයක අත්තිවාරම් සේදී යාම (Scouring) සහ ආරක්ෂිත වැටවල් විනාශ වීම සිදු විය.

● **ප්‍රධාන පාලම්:** නයාරු පාලම (මුලතිව්): දැඩි හානියට පත් වූ අතර උතුරු පළාතේ ප්‍රවාහනයට විශාල බාධාවක් විය.

● **යක්කල සහ පරගස්තොට පාලම්:** ගංවතුර රෙදි සහ අපද්‍රව්‍ය සිරවීමෙන් ව්‍යුහාත්මක දුර්වලතා ඇති විය.

**3. විදුලි බල පද්ධතිය** (Electricity)

● **පාරිභෝගික බලපෑම:** නිවාස 65,000කට අධික සංඛ්‍යාවක විදුලිය සම්පූර්ණයෙන්ම විසන්ධි විය.

● **පද්ධති හානි:** 132kv ප්‍රධාන විදුලි රැහැන් කුළුණක් (Pylon) කඩාවැටුණු අතර, උපපොළවල් (Substations) කිහිපයක් ගංවතුරින් යට විය.

● ට්‍රාන්ස්ෆෝර්මර් 1985කට හානි සිදු විය.

● සමස්ත 675,000ට ආසන්න පාරිභෝගික ජනතාවට මෙයින් බලපෑම් සිදු විය.

● ජල විදුලි බලාගාර: අධික වර්ෂාව නිසා වේලිවල ආරක්ෂාව තහවුරු කිරීමට කොත්මලේ සහ රන්ටැඹේ වැනි ප්‍රධාන බලාගාරවල ජනන කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු විය.

✧ බස්නාහිර පළාතේ විදුලිබල බිඳවැටීම් 8,718.

✧ වයඹ පළාතේ විදුලිය බිඳවැටීම් 14,960.

✧ උතුරුමැද පළාතේ සම්පූර්ණ විදුලිය බිඳවැටීම් 5,309.

✧ දකුණු පළාතේ විදුලිය බිඳවැටීම් 776.

✧ ඌව පළාත තුළ විදුලිය බිඳවැටීම් 3,831.

✧ සබරගමුව පළාත තුළ විදුලිය බිඳවැටීම් 5400.

✧ නැගෙනහිර පළාත තුළ විදුලිය බිඳවැටීම් 2,867.

✧ මධ්‍යම පළාත තුළ විදුලිය බිඳවැටීම් 10,116.

✧ උතුරු පළාත තුළ විදුලිය බිඳවැටීම් 1,308.

**4. ජල සම්පාදනය** (Water Supply Schemes)

● **නාගරික ජල යෝජනා ක්‍රම:** ප්‍රධාන නාගරික ජල යෝජනා ක්‍රම 85ක් සහ ග්‍රාමීය ජල යෝජනා ක්‍රම 537ක් අඩාල විය.

● **බලපෑමට ලක්වූ පිරිස:** නාගරික පවුල් 235,875කට ජල සැපයුම නතර විය.

(මෙම දත්ත අදාළ රාජ්‍ය ආයතන මූලාශ්‍ර ඇසුරිනි)




07 කලාපය

# වානරයාගේ සිට මිනිසා දැ

## සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස්
(Sahelanthropus tchadensis)

වානරයාගේ සිට මිනිසා දක්වා පරිණාමයේදී චිම්පන්සියාගෙන් මිනිසා වෙන්වූ මුල්ම අවධියට අයත් විශේෂයක් ලෙස සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස් හැඳින්විය හැකිය. ඔවුන් මිහිමත වාසය කර ඇත්තේ, අදින් වසර මිලියන 6-7ක පමණ කාලයකට පෙරාතුවය. අප්‍රිකානු කලාපයේ පවතින වඩා වියළි පරිසරයක් සහිත සහරානු සැවානා බිම් සහ වඩා තෙත් පරිසරයක් සහිත සුඩානියානු සැවානා බිම් අතර පිහිටි පරිවර්තනීය සැවානා කලාපය සහේල් ලෙස හැඳින්වෙන අතර, එය මෙම විශේෂය නාමකරණය සඳහා පාදක කරගෙන ඇත. එමෙන්ම මෙම විශේෂය මුල්ම වරට හමුවූයේ චැඩ් ජනරජයෙන් වීම නිසා චැඩෙන්සිස් යන නාමය ද එක්ව ඇත.

2001 වසරේදී ප්‍රංශ විද්‍යාඥයකු වූ මයිකල් බෲනට්ගේ මූලිකත්වයෙන් චැඩ් ජනරජයේ ජාතික පර්යේෂණ සහයෝගීතා ආයතනය විසින් සිදු කරන ලද ගවේෂණයකදී මෙම විශේෂයට අයත් පොසිල මුල්ම වරට සොයා ගන්නා ලදී. 2002 වසරේදී මෙම පොසිල



සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස් ගේ නිර්මිත රුවක්

එතෙක් හඳුනාගෙන නොතිබූ, අතීතයේ මිහිමත ජීවත්ව වඳව ගිය ජීවී විශේෂයකට අයත් බව තීරණය කරමින් සහෙලන්ත්‍රොපස් චැඩෙන්සිස් ලෙස නම් කරන ලදී. 2001 වසරේදී චැඩ් ජනරජයේ උතුරු ප්‍රදේශයේ පිහිටි ජුරාබ් කාන්තාරයෙන් මෙම විශේෂයට අයත් පොසිල හමුවූ ස්ථානයෙන් හැර අන් කිසිදු ප්‍රදේශයකින් මෙම විශේෂයට අයත්



සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස් පොසිල හමුවූ ප්‍රදේශය

පොසිල මෙතෙක් හමුව නැත.

නව ජීවී විශේෂයක් ලෙස විද්‍යාත්මක නාමකරණයට පෙර චැඩ් ජනරජයේ හිටපු ජනාධිපතිවරයකු වූ ඉඩ්‍රිස් ඩෙබි විසින් මෙම පොසිලය 'ටොවුමායි' ලෙස නම් කරන ලද්දේ එරට ප්‍රාදේශීය භාෂාවක් වූ ඩාසා භාෂාවෙන් 'ජීවයේ බලාපොරොත්තුව' යන අරුත සහිතවය.

මෙතෙක් හඳුනාගෙන ඇති පූර්ව-මානව විශේෂ මෙන්ම මුල්ම මානව විශේෂ හමුව ඇත්තේ, නැඟෙනහිර අප්‍රිකානු සහ දකුණු අප්‍රිකානු භූමිවලින් පමණක් (ඔස්ත්‍රෙලෝපිතකස් බහ්රෙල්ඝාසාලි හැර) වුවද, ඔවුන්ගේ පූර්වජයකු විය හැකි යැයි අනුමාන කළ හැකි සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස් බටහිර-මධ්‍යම අප්‍රිකාවෙන් හමුවීමත් සමඟ මානව පරිණාමය සම්බන්ධව මෙතෙක් විද්‍යාඥයන් විසින් ගොඩනගනු ලැබ තිබූ දැනුම තව දුරටත් පුළුල් විය. අප්‍රිකානු කලාපයේ අනෙකුත් ප්‍රදේශවලත් විවිධවූ පූර්ව මානව විශේෂ පවතින්නට ඇති බව ඒ මගින් පෙන්වා දෙනු ලැබීය.

මෙම විශේෂය අනෙකුත් වානරයන්ට සාපේක්ෂව මානවයාට ආසන්න වන මූලික හේතු කිහිපයක් හඳුනා ගනු ලැබ තිබේ. ඉන් එකක් වන්නේ ඔවුන් සතුව සාපේක්ෂව කුඩා රදනක දත් පිහිටා තිබීමයි.

දෙවැනි ප්‍රධාන කරුණ නම් සිවු පා ගමනකට වඩා දෙපයින් සිරස්ව සිට ගනිමින් ගමන් කිරීමට ඔවුන් සතුව තිබූ හැකියාවයි.



ඔරෝරින් ටුජෙනෙන්සිස්ගේ දත්ත ඇසු

කෙසේ නමුත්, සමහර විද්‍යාඥයන් තර්ක කරන්නේ ඔවුන් සිරස් ගමන් විලාශයක් සිදු




ඔරෝරින් ටුජෙනෙන්සිස් ගේ දත් කිහිපයය

කළද ගෝරිල්ලන් සහ චිම්පන්සීන් මෙන් මිට මොළවූ දෑතද ගමන් කිරීම සඳහා භාවිත කරන්නට ඇති බවයි. පාද අස්ථි සම්බන්ධව 2022න් පසු සිදු කරන ලද පර්යේෂණ හරහා මෙම අදහස් මතුව ඇත.


චැඩ්වලින් හමුවූ පොසිල දත් හොඳින් ආරක්ෂා වී නොමැති නිසා මෙම සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස්ගේ ආහාර රටාව නිවැරැදිව කිව නොහැකිමුත්, ඔවුන්

# ක්වා... 02 කොටස



රින් සකස් කරන ලද උපකල්පිත රුවක්

පලතුරු, ශාක පත්‍ර, ඇට වර්ග, ධාන්‍ය, මුල් සහ අල මෙන්ම විවිධ කෘමීන් අනුභව කරන්නට ඇතැයි අනුමාන කෙරේ. මෙතෙක් හමුව ඇති මෙම විශේෂයට අයත් එකම හිස්කබලේ කපාල ධාරිතාව ඝන සෙන්ටිමීටර් 378ක් පමණ වේ.




ක්

එය සාමාන්‍යයෙන් චිම්පන්සියකුගේ කපාල ධාරිතාවට ආසන්න වශයෙන් සමාන ය. සාපේක්ෂව පැතලි මුහුණක් තිබී ඇති අතර, දත් U හැඩයට පෙළගැසී තිබී ඇත.

සහෙලැන්ත්‍රොපස් යනු මිනිසාගේ මෙන්ම චිම්පන්සියාගේ ද පොදු පූර්වජයා බව සමහර විද්‍යාඥයන් මත පළ කරන අතර, තවත් සමහරකු පවසන්නේ චිම්පන්සියා සහ මිනිසා වෙන් වීමේ මුල් ම කාලයේ දී වර්තමාන චිම්පන්සියා පරිණාමය වීමේ මුල් ම අවස්ථාවක් ලෙස මෙම විශේෂය සැලැකිය හැකි බවයි.

තවත් සමහරකු පවසන්නේ වඩා මානව ලක්ෂණවලට සමීප වූ ආඩිපිතකස් විශේෂයන්ගේ සහෝදර විශේෂයක් ලෙස සහෙලැන්ත්‍රොපස් වෙනම පරිණාමය වන්නට ඇති බවයි. කෙසේ නමුත්, පොසිල සාක්ෂි සීමිත වීම නිසා මෙතෙක් මෙය නිවැරැදිව නිගමනය කිරීමට නොහැකි වී තිබේ.




සහෙලැන්ත්‍රොපස් චැඩෙන්සිස් හිස් කබලක්

## ඔරෝරින් ටුජෙනෙන්සිස්
(Orrorin tugenensis)

අදින් වසර මිලියන 6.1ත් 4.5ත් අතර කාලයට පෙර දී මිහි මත වාසය කරන්නට ඇතැයි සැලැකෙන ඔරෝරින් ටුජෙනෙන්සිස්ට අයත් පොසිල මුලින් ම සොයා ගනු ලැබුවේ, බ්‍රිතාන්‍ය ජාතික විද්‍යාඥ මාටින් පික්ෆෝර්ඩ් සහ ප්‍රංශ ජාතික බ්‍රිජිට් සීනට් විසින් නායකත්වය දුන් කණ්ඩායම් විසිනි. මාටින් පික්ෆෝඩ් විසින් 1974දී මෙම මානව විශේෂයට අයත් දතක් කෙන්යාවේ ටුජෙන් කඳුකරයෙන් සොයාගෙන තිබූ අතර, වර්ෂ 2000දී නැවත ටුජෙන් කඳුකරය පදනම් කරගෙන කරන ලද කැණීම්වලින් තවත් පොසිල කොටස් 20ක් පමණ සොයා ගැනීමට හැකිව තිබිණි. එහිදී ඔරෝරින් ටුජෙන්සිස් විශේෂයට අයත් 5 දෙනෙකුට අයත් අස්ථි කොටස් ස්ථාන 4කින් හමුව තිබේ.

මෙම විශේෂය නාමකරණය කිරීමේ දී ටුජෙන් භාෂාවෙන් 'සැබෑ මිනිසා' යන අරුත් දෙන 'ඔරෝරින්' වචනය යොදාගෙන ඇති අතර, ටුජෙන් කඳුකරයෙන් සොයා ගත් නිසා 'ටුජෙන්සිස්' යන නාමය ද යොදාගෙන තිබේ. මානව පරිණාම කතාවේ මුල් ම අවධිය නියෝජනය කරන ඔරෝරින් සතුව මානව ලක්ෂණ පැවතුණ ද ඔවුන් තව දුරටත් වැඩි සමානකම් දැක්වූයේ ආදි වානරයන්ට ය.

මෙම විශේෂය සතුව වර්තමාන චිම්පන්සීන්ට සමාන විශාලත්වයෙන් යුත් මොළයක් සහ ඔවුන්ට ම සමාන ශරීර හැඩයක් පවතින්නට ඇතැයි විශ්වාස කෙරේ. කෙසේ නමුත්, පොසිල සාක්ෂි අල්ප වීම නිසා ඔරෝරින්ගේ කපාල ධාරිතාව




දැනට හමුවී ඇති ඔරෝරින් අස්ථි කිහිපයක්

මෙතෙක් නිවැරැදිව ගණනය කර නැත. හමුවී ඇති පාද අස්ථි අනුව ඔරෝරින්ට දෙපයින් ඇවිදීමේ හැකියාව තිබී ඇති බව විද්‍යාඥයෝ පවසති. එහෙත්, දෙපයින් නොඇවිදින, ශාක මත වාසය කරන වානර විශේෂවල පාද අස්ථි සතු ලක්ෂණ ද ඔරෝරින්ගේ පාද අස්ථි තුළ දැකිය හැකි ය. එම නිසා එම පාද අස්ථි මානව විශේෂ හෝ ආදී වානර විශේෂවලට වඩා පූර්ව ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ට සමාන බව පෙනී යයි. එමෙන් ම ඔරෝරින්ගේ අත්

ජාත්‍යන්තර තොරතුරු
GLOBAL NEWS

# වෙනිසියුලානු ජනපති අධිරාජ්‍යවාදීහු පැහැර ගනිති



පසුගිය ජනවාරි 3වන දින උදෑසන ඇමෙරිකානු හමුදා විසින් වෙනිසියුලාව ආක්‍රමණය කරමින් වෙනිසියුලාවේ ජනාධිපති නිකලස් මදුරෝ සහ ඔහුගේ බිරිඳ පැහැර ගන්නා ලද අතර, පසුව ඔවුන් දෙදෙනා ඇමෙරිකාව වෙත රැගෙන යන ලදී. නිකලස් මදුරෝ සහ බිරිඳ වෙත ඇමෙරිකාව විසින් එල්ල කරන ලද චෝදනාව වූයේ මත්ද්‍රව්‍ය වෙළෙඳම සඳහා වෙනිසියුලානු හමුදා යොදා ගනිමින්, කටයුතු කිරීමයි. ඒ අනුව ජනවාරි තුන උදෑසන වන විට වෙනිසියුලාවේ කැරකස් අගනුවරට බෝම්බ ප්‍රහාර එල්ල කරමින්, ඇමෙරිකාව විසින් මෙම පැහැර ගැනීම ආරම්භ කරන ලදී.

ලතින් ඇමෙරිකානු කලාපය ස්පාඤ්ඤ යටත්විජිත යුගය තුළ සිටම අධිරාජ්‍ය විරෝධී සටන් සඳහා ප්‍රබල භූමියක් විය. ලතින් ඇමෙරිකානු කලාපයේ කාර්මික සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අතිශය සාරවත් භූමි ප්‍රදේශ අතීතයේ සිටම අධිරාජ්‍යවාදයේ ගොදුරු බිම් බවට පත් විය. විසිවන සියවසේ මැදභාගයේ සිට ගොඩනැගුණු ශක්තිමත් අධිරාජ්‍ය විරෝධී අරගල හරහා අධිරාජ්‍ය විරෝධී ආණ්ඩු සහ බලවේග මෙම කලාපය තුළ ගොඩනැගෙන්නට විය.

සෝවියට් දේශය බිඳවැටීමත් සමඟ මෙම ආණ්ඩුවලින් සැලැකිය යුතු ප්‍රමාණයක් බිඳවැටුණු අතර, නැවත මෙම අධිරාජ්‍ය විරෝධී රැල්ල පුනරුදය ලබන්නේ වෙනිසියුලාවේ හියුගෝ චාවේස් හරහා ය. 1999දී හියුගෝ චාවේස් වෙනිසියුලාවේ බලයට පැමිණීමත් සමඟ ලතින් ඇමෙරිකානු කලාපය තුළ අධිරාජ්‍ය විරෝධී බලවේග ශක්තිමත් වීම ආරම්භ විය. එය 'රෝස රැල්ල' නමින් හඳුන්වන ලදී.

2002දී සිදුවූ චාවේස්ට එරෙහිව අධිරාජ්‍යවාදයේ සහාය ලැබූ කුමන්ත්‍රණයත් සමඟ වෙනිසියුලාව තුළ අධිරාජ්‍ය විරෝධී ක්‍රියාමාර්ග සඳහා පදනම ශක්තිමත් විය. 2002 කුමන්ත්‍රණය හරහා එතෙක් අධිරාජ්‍යවාදී සමාගම් අත පැවැති තෙල් පිරිපහදු කිරීමේ බලය වෙනිසියුලානු ජනතාව මැදිහත්ව ජනසතුකරණය ආරම්භ කරමින් තමන් සතු කර ගන්නා ලදී. මේ සමඟම වෙනිසියුලාව සහ ඇමෙරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදය අතර ගැටුම නව මුහුණුවරකට එළැඹිණි. මෙතැන් සිට ඇමෙරිකාව හරහා වෙනිසියුලානු ආර්ථිකයට දැඩි සම්බාධක එල්ල කිරීම ආරම්භ විය.

මත්ද්‍රව්‍ය වෙළෙඳාම සම්බන්ධයෙන් වෙනිසියුලානු ජනාධිපති නිකලස් මදුරෝ හට ක්‍රමිකව චෝදනා උත්සන්න කිරීම ඇමෙරිකානු පාලනය විසින් 2020දී ආරම්භ කරන ලදී. පසුගිය අගෝස්තුවේදී මදුරෝ අත්අඩංගුවට ගැනීම සඳහා ඩොලර් මිලියන පනහක මුදල් ත්‍යාගයක් ඇමෙරිකාව විසින් ලබා දෙනු ලබන බවට ප්‍රකාශ කරන ලදී. එලෙසම වෙනිසියුලානු මුහුදු කලාපය ඇමෙරිකානු හමුදා විසින් ආක්‍රමණය කිරීම ආරම්භ කරන ලදී. වෙනිසියුලාවේ වෙළෙඳාම සම්බන්ධයෙන් - විශේෂයෙන්ම බොරතෙල් වෙළඳාම සම්බන්ධයෙන් - සම්බාධක පනවන ලදී. මෙම ක්‍රියාමාර්ගත් සමඟ අධිරාජ්‍යවාදයේ පීඩනය ක්‍රමිකව උත්සන්නවූ අතර, ජනවාරි තුන්වන දින මෙම පැහැර ගැනීම සිදු විය.

මෙම මෙහෙයුමෙන් පසුව ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් අදහස් දක්වමින් ප්‍රකාශ කළේ; වෙනිසියුලාවේ තෙල් සම්පත පාලනයට ඇමෙරිකානු සමාගම් මැදිහත් විය යුතු බවත්, ඒ සඳහා වෙනිසියුලානු උපජනාධිපති ඩෙලිසි රොඩ්‍රිගස් සහාය නොදැක්වුවහොත්, ඒ සඳහා ගෙවිය යුතු වන්දිය විශාල බවත්, බොහෝ විට මදුරෝටත් වඩා වන්දියක් ගෙවීමට සිදුවිය හැකි බවත්ය. මේ වන විට ඇමෙරිකා එක්සත් ජනපදයට රැගෙන ගොස් ඇති නිකලස් මදුරෝ සහ ඔහුගේ බිරිඳ ඇමෙරිකා එක්සත් ජනපදය තුළ නඩු විභාගයකට ඉදිරිපත් කොට සිටිති.

ඇමෙරිකානු ඉතිහාසය තුළ අනෙකුත් රාජ්‍යවල ස්වෛරීත්වයට අභියෝග කරමින්, සිදු කරනු ලබන මෙම ආක්‍රමණ ක්‍රියාවලිය ඉතිහාසයට නව තත්ත්වයක් නොවේ. මොන්රෝ සම්මුතිය හරහා එක්සත් ජනපදය තුළ මෙවැනි ක්‍රියාවලට සදාචාරමය ආවරණය ඇමෙරිකාව ගොඩනගා ගන්නා ලදී. 19 වන සියවසේ උතුරු සහ දකුණු ඇමෙරිකානු කලාපවලට සිදු කරනු ලබන යුරෝපීය මැදිහත්වීම් වලට එරෙහිව ගොඩනගා ගන්නා ලද මොන්රෝ සම්මුතිය පසුකාලීනව ලතින් ඇමෙරිකානු කලාපයට සිදු කරනු ලබන බලපෑම් සඳහා ද යොදා ගන්නා ලදී.

වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මදුරෝ පැහැර ගැනීමත් සමඟ මේ වන විට මෙම ක්‍රියාවලියට එරෙහිව ලොව පුරා ප්‍රගතිශීලී ජනතාවගෙන් සහ රාජ්‍යවලින් ඇමෙරිකාවට විරෝධය එල්ල වී ඇති අතර, පසුගිය කාලය පුරාම ඇමෙරිකාව විසින් වෙනිසියුලාවට එරෙහිව කරන ලද ක්‍රියා සම්බන්ධව තම සතුට ප්‍රකාශ කරන ලද එරට විපක්ෂයේ සුළුතර විරෝධතා මැද වෙනිසියුලානු ජනතාව තම රටේ ස්වෛරීත්වය රැක ගැනීම සඳහා සටන්වලට පණ පොවමින් සිටිති. එසේම මෙම ආක්‍රමණයත් සමඟ ලෝක සාමය සම්බන්ධයෙන් එක්සත් ජාතීන් වැනි සංවිධානවල කාර්යභාරය සහ වලංගුභාවය පිළිබඳව නව සංවාදයක් ජාත්‍යන්තරය තුළ මතුව ඇත.

## දිට්වා සහ ආර්ථිකය ....

01 - පිටුවෙන්

නොදුන් සහනාධාර ප්‍රමාණයක් ලබා දීමට කටයුතු සලසනු ලැබීය. ඒ අනුව රුපියල් කෝටියේ සිට වන්දි මුදල් ලබා දීමට රජය එකඟ වී ඇත. සම්පූර්ණයෙන් ගෙය සහ ඉඩම අහිමි වන අයකුට රුපියල් කෝටියක මුදලක් ලැබෙන අතර, නිවාස පිරිසිදු කර ගැනීම සඳහා ඉතා ඉක්මනින් ආපදාවට ලක්වූ සියලුම දෙනාට රුපියල් 25,000.00ක මුදලක් ලබා දීමත් මෙවර විශේෂයක් ලෙස පෙනිණි. සමහර විපක්ෂයේ අය ආර්ථික අර්බුදයක සිහින දකිද්දී, අපට පාර්ලිමේන්තුවෙන් රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කර ගැනීමට හැකි විය.

මී ළඟ ගැටලුව බවට සමහර අය තර්ක කළේ මෙම මුදල් වියදම් කිරීම නිසා රට තුළ උද්ධමන තත්ත්වයක් ඇති වන බවයි. මෙම මුදලට අමතරව දෙසැම්බර් මස අවසාන වන විට ආධාර ගිණුමට එකතුවූ රුපියල් බිලියන 07ක මුදලත්, විදෙස් රටවලින් ලද තවත් විවිධ වර්ගයේ ආධාරත් ලෙස එකතුවූ සියලු මුදල් ආර්ථිකයට එක්වූ විට උද්ධමනයක් ඇති වන බවයි. රටක උද්ධමනයක් ඇතිවීමට භාණ්ඩ නිෂ්පාදනය සහ මුදල් අච්චු ගැසීම අතර ගැටලුවක් ඇති විය යුතුය. මෙම ආධාර ලෙස ලබා දෙන මුදල් මහා භාණ්ඩාගාරය ලබා ගන්නේ කාසි සහ නෝට්ටු අච්චු ගැසීමෙන් නොවේ. ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ නොගොස් එම ආර්ථික තත්ත්වයේදී මිනිසුන් අතට මුදල් පැමිණි විට ඔවුන්ගේ මිලදී ගැනීමේ හැකියාව (ක්‍රය ශක්තිය) ඉහළ යයි. ඊට සමානව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ ගොස් නොතිබුණහොත්, ඉල්ලුම වැඩි නිසා භාණ්ඩ හා සේවා මිල ඉහළ යයි. ඒ අනුව ආර්ථිකයේ උද්ධමන තත්ත්වයක් නිර්මාණය වේ. එහෙත්, අප මෙම රුපියල් බිලියන 500 ලබා ගන්නේ මුදල් අච්චු ගැසීමෙන් නොවේ. එම නිසා එම වියදමෙන් ඔවුන් බලාපොරොත්තු වන උද්ධමන තත්ත්වයක් රට තුළ නිර්මාණය වීමට ඉඩකඩක් නොමැත.

එහෙත්, කෙටි කාලයකදී ජනතාව අතට විශාල මුදල් ප්‍රමාණයක් ලැබෙන නිසා වෙනත් ආර්ථික ගැටලු නිර්මාණය වීමේ විභවයක් පවතී. ඒවා විශාල ආර්ථික අර්බුද නොවන අතර, කෙටි කාලයකට සීමා වන ඒවා වේ. විශේෂයෙන්ම ආපදාවට ලක්වූ පුද්ගලයන්ගේ ආපදාවට ලක්වූ භාණ්ඩ සහ උපකරණ නැවත මිලදී ගැනීමට සිදුවීමේදී මෙවැනි ගැටලුකාරී තත්ත්වයක් සමහරවිට ඇතිවීමට ඉඩ තිබේ. ඉදිකිරීම් අංශයට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපකරණ බොහොමයක් පිටරටින් ආනයනය කිරීමට සිදුවේ. එලෙසම ජන ජීවිත පවත්වාගෙන යාමට අවැසි බොහෝ දේද ආනයනය කරනු ලබන භාණ්ඩ නිසා ආනයන වියදම ඉහළ යා හැකිය. කෙටි කලකදී මෙලෙස ආනයන ඉහළ යාම නිසා එය ඩොලරය ඉහළ යාමට බලපෑමක් කළ හැකිය. මෙම තත්ත්වයට පසුගිය වසරේ වාහන ආනයන කිරීමේදී ඇතිවූ අවාසිදායක තත්ත්වයද හේතුවිය හැකිය. පසුගිය වසරේ වාහන ආනයනය සඳහා රජය සැලැසුම් කර තිබුණේ ඩොලර් මිලියන 1,200ක පමණ වියදමකි. එහෙත්, වසර අවසාන වන විට එය ඩොලර් මිලියන 1,800ක් දක්වා ඉහළ ගොස් තිබුණු අතර, එය මේ වසර වන විට මිලියන 2,200ක් දක්වා ඉහළ යා හැකි බවට අනතුරු ඇඟවේ. කෙසේ වෙතත්, එවැනි තත්ත්වයක් ඇති නොවන්නට රජයට ආර්ථිකය කළමනාකරණය කර ගත හැකිය. එම නිසා දිට්වා සුළි කුණාටුවෙන් බොහෝ අවාසිසහගත තත්ත්වයන් නිර්මාණය වුවද, ඒවාට සාර්ථකව සහ ශක්තිමත්ව මුහුණ දීමට රජයට හැකි නිසා මෙම තත්ත්වය කෙටි කලකින් සමනය කර ගැනීමට හැකි වේ යයි සිතීම සාධාරණය.

## වානරයාගේ සිට මිනිසා දක්වා ....

04-05 - පිටුවෙන්

සහ ඇඟිලිවල කවාකාර අස්ථි පෙන්නුම් කරන්නේ ඔවුන්ට ශාක මත ජීවත්වීමේ හැකියාවද පැවත ඇති බවයි. අනෙකුත් වානර විශේෂවලට සාපේක්ෂව කුඩා දත් ඔරෝරින්ට පිහිටා තිබුණද, ඔවුන්ගේ රදනක දත් නූතන මානවයන්ට සාපේක්ෂව ප්‍රමාණයෙන් විශාල සහ තියුණු වූයේ මානවයාට වඩා වානර විශේෂවලට සමාන ආකාරයටය.

චිම්පන්සීන් මෙන් ඇට වර්ග තළා ගැනීම ආදී දේ සඳහා ඔරෝරින් ගල්, ලී කැබලි ආදිය භාවිත කළද ඒවා ආයුධ ලෙස විධිමත්ව තෝරා ගැනීමක් හෝ සැකසීමක් සිදුකර ඇති බවට සාක්ෂි නොමැත. සාපේක්ෂව විශාල, පැතලි චාර්වක දත් පැවැතීම නිසා මෙම විශේෂය පලතුරු, ඇට වර්ග, අල වර්ග ආදී ශාකමය ආහාර වැඩි වශයෙන් භාවිත කරන්නට ඇති බවත්, විශේෂ අවස්ථාවලදී මස් ආහාරයට ගන්නට ඇති බවත් විශ්වාස කෙරේ. එමෙන්ම ආදි මානව විශේෂ මෙන් සැවානා බිම්වල ජීවත් වනවා වෙනුවට වියළි, සදාහරිත වනාන්තර සිය වාසභූමිය ලෙස ඔරෝරින් විසින් තෝරාගෙන තිබිණි.

ඔරෝරින් ටුජෙනෙන්සිස්ගේ සම්භවය සිදුවූයේ කුමන විශේෂය පරිණාමය වීමෙන්ද යන්නත්, ඔරෝරින් ටුජෙනෙන්සිස් මිහිමතින් සම්පූර්ණයෙන් වඳවී ගියාද නැතහොත් වෙනත් විශේෂයක් බවට පරිණාමය වූවාද යන්නත් පිළිබඳව මෙතෙක් අවසන් නිගමනයකට එළැඹ නැත. එහෙත් ඔවුන්ගේ පාද අස්ථි සම්බන්ධව පර්යේෂණ සිදු කළ සමහර විද්‍යාඥයන් පවසන්නේ අදින් වසර මිලියන 6කට පෙර, එනම් ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂ බිහිවීමට පෙර ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ටත් වඩා පහසුවෙන් දෙපයින් ඇවිද යාමේ හැකියාවක් සහිතව ඔරෝරින් ටුජෙනෙන්සිස් ජීවත්වන්නට ඇති බවයි. එනම් 'ලූසී'ට වඩා පහසුවෙන් ඔරෝරින් ටුජෙන්සිස් දෙපයින් ඇවිද ගොස් ඇති බවයි. ඒ අනුව හෝමෝ විශේෂ බිහිවූයේ ඔස්ත්‍රෙලෝපිතකස් හරහා නොව සෘජුවම ඔරෝරින් පරිණාමය වීමේ ප්‍රතිඵලයක් ලෙසට බවද ඔවුහු උපකල්පනය කරති. එහෙත් එය සනාථ කළ හැකි ආකාරයට ප්‍රමාණවත් සාක්ෂි මෙතෙක් ලැබී නොමැත.

## ලෙනින් කියවමු......

08 - පිටුවෙන්

✧ **අවස්ථාවාදයට, නිලධාරීවාදයට එරෙහි සටන සහ බොල්ෂෙවික් පක්ෂය ගොඩනැඟීම (ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය ප්‍රතිපත්තිය යටතේ).**

ආදී වශයෙන් මාක්ස්වාදී න්‍යාය තව දුරටත් සංවර්ධනය කළ අතර, විවිධ ක්ෂේත්‍රයන්ගේ දක්ෂතා සහිත පුද්ගලයන් සමඟ මනා සබඳතාවක් සහ මිතුදමක් පවත්වා ගනිමින්, රුසියාවේ සමාජවාදය ගොඩනැඟීමට නායකත්වය දෙනු ලැබීය. ලෝකප්‍රකට ගත්කරුවකුවූ මක්සිම් ගෝර්කි සමඟ පැවැති මිතුදම මෙන්ම මොස්කව් නගරය යළි නිර්මාණය කිරීමේදී, සාර් පාලන කාලයේ ඉදිකිරීම්වලට මුල්වූ දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියකුවූ අයි.වී. සොල්ටොව්ස්කි යොදා ගැනීම, අධ්‍යාපනය, කලා සහ සංස්කෘතික ක්ෂේත්‍රයේ බුද්ධිමතකුවූ ලූනාචාර්ස්කිට සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍ය වගකීම භාර දෙමින්, කටයුතු කිරීම තුළින්ද පෙන්නුම් කරනු ලබන්නේ ලෙනින් තුළ පැවැති මෙම න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයයි.

# ලෙනින් කියවමු!

**මැතිවරණයකින් ආණ්ඩු බලයක් පිහිටුවා ඇති පක්ෂයක් වන අප හමුවේ ඇති ප්‍රධානතම අභියෝගය වන්නේ මෙම ආණ්ඩු බලය සමාජ පරිවර්තනයක් කරා මෙහෙයැවීමයි. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අත්දැකීම් සමග සසඳ බැලීමේ දී මෙය විශේෂ තත්ත්වයක් මෙන්ම ඒ තුළ අභියෝග ගණනාවක්ද පවතී. එම අභියෝග ජය ගැනීමේ දී ලෙනින්ගේ ජීවිතයෙන් සහ භාවිතාවෙන් උගත හැකි පාඩම් බොහෝය.**

"ඔහුගේ ඉතාම හොඳ පිළිරුවලින් සහ ඡායාරූපවලින් වුවද මැවී පෙනෙන්නේ ඔහුගේ නිශ්චල රූපය පමණකි. එහෙත්, නොපෙනෙන අනාගතය තුළට පිවිසෙන සියුම් මනසක් හා චිත්ත ස්වභාවයක් ඇති ඔහු සමග නිශ්චලත්වය කිසිසේත්ම ගැළපිය හැකි නොවේ.

"මිනිසකු පූජා පිළිමයක් බවට පත් කළ නොහැකි බව මම දනිමි. එහෙත්. ලෙනින් කෙරෙහි මා සිතෙහි පවතින්නේ අසීමිත ගෞරවයක්, ආදරයක් සහ කෘතඥතා හැඟීමකි. ඒ කොතරම්ද කිවහොත්, කිසිම දෙයක් ඔහුට සමාන කිරීමට මම අසමත් වෙමි."

-සෝවියට් ලේඛක නිකොලායි ග්‍රිබ්චොව්.

ඔහු මිය ගොස් පසුගිය ජනවාරි 21 වැනි දිනට වසර 102ක් සපිරිණි. ඔහුගේ දැනුම එක දහරාවකට පමණක් සීමා නොවීය. දර්ශනය, දේශපාලනය, ආර්ථික විද්‍යාව, කම්කරු පන්තිය, කාන්තා විමුක්තිය, ගොවි ජන අරගලය, ශිෂ්‍ය, තරුණ, ළමා කටයුතු, ප්‍රජාතන්ත්‍රවාදය, සංස්කෘතිය ආදී සියලු ක්ෂේත්‍රවල ඔහු තම දැනුම සහ ප්‍රායෝගික භාවිතාව පතුරුවාලීය. ලේඛකයකු ලෙස ඔහු අතින් ලියැවුණු කෘති ප්‍රමාණය අතිවිශාලය. ඔහු කළ කතා සහ ලිපි දහස් ගණනකි. ඒවායේ ඇති කරුණු අත්හැර දැමීමට නොහැකි තරම් අදටද වලංගුය; ප්‍රබලය. දාර්ශනිකයෙකු, සංවිධායකයකු, නායකයකු මෙන්ම අචල කොමියුනිස්ට්වාදියකු පමණක් නොව ඔහු අතිශය සරල, ප්‍රායෝගික මිනිසකුද වෙයි. එක් පුද්ගලයකු තුළ මෙවැනි ගුණාංග සමුදායක් කැටිවී තිබීම විශේෂත්වයකි. ලෙනින් කියවා ගැනීම වැදගත් වන්නේ එම නිසාය.

**ජීවන තොරතුරු:**

ව්ලැදිමීර් ඉල්යිච් උල්යානොව් (ලෙනින්) 1870 අප්‍රේල් මස 10 (22) වැනි දින වොල්ගා නදිය අසබඩ පිහිටි සිම්බීර්ස්ක් නගරයෙහි උපත ලැබීය. උල්යානොව් පවුලේ දරු, දැරියන් සය දෙනකුවූ අතර, ඔවුන්ට නිදහස් මතධාරී පුළුල් අධ්‍යාපනයක් ලබා දීමට කළ හැකි සෑම දෙයක්ම දෙමවුපියෝ කළහ. ඔහු ප්‍රීතිමත්, විනෝදකාමී ළමයකු විය. කුඩා කල පුළුල් ලෙස පොත-පත කියැවූ ඔහු පුෂ්කින්, ලෙර්මන්තව්, ගොගොල්, තුර්ගේනෙව්, නෙක්‍රාසව්, සල්තිකොව්-ශෙද්‍රින් සහ ලියෝ තොල්ස්තෝයි වැනි ශ්‍රේෂ්ඨ රුසියානු ගත්කරුවන්ගේ කෘති කියැවීමට පුරුදුව සිටියේය.

ප්‍රවේණිදාස ක්‍රමයේ අචල විරුද්ධවාදියකුවූ චෙර්නිෂෙව්ස්කිගේ 'කළ යුත්තේ කුමක්ද?' පොත කෙරෙහි ඔහු විශේෂ අවධානයක් යොමු කළේය. එමෙන්ම දැඩි අධිෂ්ඨානයකින් සහ උසස් ප්‍රතිපත්තිවලින් හෙබි සිය සොහොයුරාවූ ඇලෙක්සැන්ඩර් (1887දී සාර් පාලනය විසින් ඔහු ඝාතනය කරනු ලැබීය.) ලෙනින් කෙරෙහි බලපෑමක් ඇති කළේය.

- 1887 අගෝස්තුවල රන් පදක්කමක් දිනා ගනිමින්, උසස් පාසලේ අධ්‍යාපනය අවසන් කළ ඔහු කසාක් විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළු විය. දේශපාලන ක්‍රියාකාරකම් නිසා ඔහු ඉන් නෙරපාහරිනු ලැබීය.
- 1891දී ශාන්ත පීටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ බාහිර අපේක්ෂකයකු ලෙස නීති උපාධිය ලබා ගැනීම.
- 1880 දශකයේ බිහිවූ මාක්ස්වාදී අධ්‍යයන කවවලට සම්බන්ධවූ ලෙනින්, 1892දී සමාරාහි මාක්ස්වාදී අධ්‍යයන කවය සංවිධානය කළේය.
- 1895දී ලෙනින් සිරභාරයට ගනු ලැබීය.
- 1897දී ලෙනින් නැගෙනහිර සයිබීරියාවට පිටුවහල් කරනු ලැබීය. කෲප්ස්කායා හමු වන්නේ එහිදීය.

පිටුවහල් වෙමින්ද, සැඟවී සිටිමින් මෙන්ම බොහෝ කාලයක් රටින් බැහැරව සිටිමින්ද තම විප්ලවවාදී භාවිතාව මැනැවින් පෙන්නුම් කළ ඔහු 1917 ඔක්තෝබර් විප්ලවයට නායකත්වය දෙමින්, ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍යය බිහි කළේය.


පසුව 1919දී තුන්වැනි ජාත්‍යන්තරය ගොඩනැගීමට නායකත්වය දෙනු ලැබීය.

- 1918 අගෝස්තු 30 වැනිදා කැනී කැප්ලන් නම් එස්.එර්. පාක්ෂික කාන්තාවක් විසින් ලෙනින්ට වෙඩි තබනු ලැබීය. ඒ හේතුකොටගෙන අසනීපව සිටි ලෙනින් 1924 ජනවාරි 21 වැනිදා මියගියේය.

**න්‍යාය භාවිතාවට නැඟීම සහ ලෙනින්:**

- අධිරාජ්‍යවාදය හඳුනා ගැනීම.
- සමාජවාදී විප්ලවය පසුගාමී රටක වුව පැනනැඟිය හැකි බව තහවුරු කිරීම.
- ධනේශ්වර නොවන සංවර්ධන මාවත.
- සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙක.
- 1917 අප්‍රේල් තිසීස.
- 1917 ඔක්තෝබර් විප්ලවයට අවස්ථාව තෝරා ගැනීම.
- 1919දී තුන්වැනි ජාත්‍යන්තරය ගොඩනැගීම.
- පාර්ලිමේන්තුව පිළිබඳ ස්ථාවරය.
- නව ආර්ථික ප්‍රතිපත්ති (NEP) හඳුන්වා දීම.

07 පිටුව



**"සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳ පැරැණි රජ්දහන තුළ සිට කටයුතු කිරීම සරලය; පහසුය. නමුත්, අලුත් මාවතක යාමට අපට වුවමනාවී තිබේ. එම මාර්ගයේ යාම සඳහා අප සහ සියලුම ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥ්ඥාණයක් හා සංවිධානයක් අවශ්‍යය. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන අතර, එහිදී වඩාත් බරපතළ වැරැදි සිදුවේ. නමුත්, වැරැදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි කියන්නෙමු."**

**-ලෙනින්, තෝරා ගත් කෘති - 8 වෙළුම, 149-150 පිටු.**